**225**

රත් දහදිය වගුරා සිරුරේ ජනතා සුබ සෙත පිණිසැ ලොවේ
සමිඳුනි අප කරනා සේවේ ඔබේ නමට පුද පූජා වේ

සමිඳේ ඔබ මට ප්‍රෙම කලෝ මිල දී ඔබ නොවැ මා ගත්තෝ
වෙන කාටත් මා අයිති නොවේ මා ඔබ සන්තක වේ සමිඳේ

මා ඔබ හට නොවැ ගැතිවත්තේ සේවකයකු සේ කිතු සමිඳේ
මගේ මනාපය නොවේ නොවේ ඔබේ කැමැත්තට ම. හිස නැමේ

ඔබයි මගේ එක හාම්පුතා ඔබේ අතේ ජීවිතේ මගේ
ඔබ පිය හසරේ මා එන්නේ ඔබ මා ගමනේ අවසානේ

ඔබට ලැදි වැ මෙහෙ කිරීම වේ සැපතට එයින් මැ මඟ හෙළිවේ
ගැතියකු වනු කිතු සමිඳුන්ගේ රජකමට මැ එය නිසි මඟ වේ